# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2190/24 - 2020 අගෝස්තු මස 25 වැනි අඟහරුවාදා - 2020.08.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ නිවේදන

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු සංශෝධිත මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 277(1අ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර නීතිඥ ලලිත් යූ. ගමගේ වන මම මාතලේ මහ නගර සභාවේ නගරාධිපතිවරයා විසින් සංශෝධිත මහ නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 277 (1) වගන්තියේ සඳහන් වැරදි කිසිවක් සිදුකර ඇත්තේද යන්න පිළිබඳව මෙම දැන්වීමේ දින සිට මාස තුනක කාල සීමාවක් ඇතුළත පරීක්ෂා කොට මා වෙත වාර්තා කිරීම සඳහා විශ්‍රාමලත් අධිකරණ නිලධාරිණී සරෝජිනී කුසලා වීරවර්ධන මහත්මිය මෙයින් පත් කරමි.

මෙම නිලධාරිණියට මෙම පරීක්ෂණයට අදාලව පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද කොමිසමක බලතල ඇත්තේය.

**නීතිඥ ලලිත් යූ. ගමගේ,**
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර.

2020 අගෝස්තු මස 24 වැනි දින,
මහනුවර දී ය.

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ නිවේදන

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු සංශෝධිත මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 277 (1ආ) (අ) (i) වගන්තිය යටතේ කරනු ලබන නියමය.

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු සංශෝධිත මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 277 (1ආ) (අ) (i) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර නීතිඥ ලලිත් යූ. ගමගේ වන මම මාතලේ මහ නගර සභාවේ නගරාධිපති වන ඩල්ජිත් නන්දලාල් අලුවිහාරේ මහතා එම ධූරය දැරීම වහාම ක්‍රියාත්මක වන පරිදි තාවකාලිකව අත්හිටුවමි.

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු සංශෝධිත මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 277 (1ආ) (අ) (i) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වහාම ක්‍රියාත්මක වන පරිදි මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ. මාතලේ මහ නගර සභාවේ නගරාධිපතිවරයාගේ කාර්යයන් ඉටු කිරීමට හා එහි බලතල ක්‍රියාත්මක කිරීමට මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ මහ නගර සභාවේ දැනට නියෝජ්‍ය නගරාධිපති ධූරයේ කටයුතු කරනු ලබන සන්දනම් ප්‍රකාශ් මහතාට නියෝග කරමි.

**නීතිඥ ලලිත් යූ. ගමගේ,**
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර.

2020 අගෝස්තු මස 24 වැනි දින,
මහනුවර දී ය.

09 - 215

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.